සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

Learning Resource Centre
De Mazenod College
Kandana

# වර්ෂ අවසාන ඇගයීම - 2024 (2025)
# ஆண்டிறுதி மதிப்பீடு - 2024 (2025)
# Year End Evaluation - 2024 (2025)

| ශ්‍රේණිය / தரம் / Grade | 08 | විෂයය / பாடம் / Subject | ගණිතය | පත්‍රය / வினாத்தாள் / Paper | I, II | කාලය / காலம் / Time | පැය 02 යි |
|---|---|---|---|---|---|---|---|

නම / பெயர் / Name ......................................................... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ...........................

## I පත්‍රය

- 01 සිට 20 තෙක් ප්‍රශ්න සියල්ලට ම මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
- එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් හිමිවේ.

01. 5, 11, 17, 23 ...... මෙම සංඛ්‍යා රටාවේ පොදු පදය සොයන්න.

02. බෝතලයක් තුළ පාට පැන්සල් 9ක් ඇත. ඉන් 3ක් රතු පාට ද, 2ක් කොළ පාට ද, අනෙක්වා නිල් පාට ද වේ. බෝතලයෙන් අහඹු ලෙස ඉවතට ගන්නා පැන්සලක් නිල්පාට වීමේ සම්භාවිතාව සොයන්න.

03. i. සුළු කරන්න. $(-5k) \times 2k$

ii. හිස්තැන සම්පූර්ණ කරන්න. $2p + 4pq = 2p\,(1 + \text{..........})$

04. දී ඇති රූපයේ පරිමිතිය 36cm වේ. $a$ හි අගය සොයන්න.




05. සංඛ්‍යා රේඛාව මත නිරූපණය කර ඇති අසමානතාව වීජීය අසමානතාවයකින් දක්වන්න.




06. පිළිතුරු ලෙස (-3) ලැබෙන්නේ පහත කුමන අවස්ථාවේ ද?

i. $(-2) + (-5)$

ii. $(-12) \div (+3)$

iii. $(+4) - (+7)$

07. සවිධි ටෙසලාකරණයක් සඳහා යොදා ගත හැකි බහු අස්‍ර 2ක් නම් කරන්න.

08. දී ඇති රූපයේ තොරතුරු අනුව

i. $A\hat{B}C$ අගය සොයන්න.

ii. $A\hat{D}C$ අගය සොයන්න.




09 1:50 000 පරිමාණයට අඳින ලද සිතියමක නගර දෙකක් අතර දුර 10cm කින් දැක්වේ. නගර දෙක අතර සැබෑ දුර km වලින් සොයන්න.

10. $\sqrt{196}$ හි අගය ප්‍රථමක සාධක භාවිතයෙන් සොයන්න.

11. පහත ප්‍රකාශ හොඳින් කියවා නිවැරදි නම් "✓" ලකුණ ද, වැරදි නම් "×" ලකුණ ද වරහන තුළ යොදන්න.

i. ද්විපාර්ශ්වික සමමිතිය නැති තල රූපවලට ද භ්‍රමක ද සමමිතිය තිබිය හැකිය. ( )

ii. රොම්බසයක භ්‍රමක සමමිති ගණය 4 වේ. ( )

12. B හා C ස්ථානවල සිට A හි පිහිටීම දැක්වෙන රූප සටහනක් මෙහි දැක්වේ.




i. B සිට A පිහිටි දිශාව ලියන්න.

ii. C සිට A පිහිටි දිශාව ලියන්න.

13. විසඳන්න. $\frac{p}{4}-3=2$

14. $5 \div \frac{1}{4}$ හි අගය ලබාගන්න.

15. -3 කාල කලාපයේ වේලාව සඳුදා දිනක 08:30 වන විට +2 කාල කලාපයේ පිහිටි ග්‍රීසියේ ඇතැන්ස් නගරයේ වේලාව සොයන්න.

16. i. හිස්තැන් පුරවන්න.

වෘත්තයක ජ්‍යායකින් හා චාප කොටසකින් මායිම් වූ වෘත්ත කොටසක් ............................................ ලෙස හැඳින්වේ.

ii. දී ඇති රූපයේ කේන්ද්‍රික ඛණ්ඩයක් ඇඳ අඳුරු කර දක්වන්න.



17. පන්තියක මුළු සිසුන් ගණන 40කි. ඉන් 22 ක් ගැහැණු ළමයි වේ. පිරිමි ළමයි ගණන මුළු සිසුන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස දක්වන්න.

18. දී ඇති රූපයේ තොරතුරු අනුව $x$ හි අගය සොයන්න.




19. $a = (-1)^{25}$ ද $b = 2^3$ ද $c = (-1)^{10}$ ද වේ. හිස්තැන් සඳහා සුදුසු $>$, $<$ හෝ $=$ යොදන්න.

$a$ ....................b

c ....................$a$

20. ශිෂ්‍යයෙක් පොතක් නිර්මාණය කිරීම සඳහා සතියක් තුළ එක් එක් දිනවල යෙදුණු කාලය මිනිත්තුවලින් පහත දැක්වේ. එම දත්තවල මධ්‍යස්ථය සොයන්න.

30, 35, 38, 42, 40, 43, 50

## II පත්‍රය

- පළමු ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න හතරකටත් පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 16 ක් ද අනෙක් එක් එක් ප්‍රශ්නය සඳහා ලකුණු 11 බැගින් ද හිමිවේ.

01. (a) ඔබේ ගුරුතුමා/ගුරුතුමියගේ උපදෙස් පරිදි ඉගෙන ගන්නා ලද "ත්‍රිකෝණ නිර්මාණය" පාඩමේ ක්‍රියාකාරකම් හා විෂයය කරුණු සිහිපත් කරගෙන පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

ත්‍රිකෝණ නිර්මාණ පාඩමේ දී ඕනෑම ඉරටු කැබලි 3කින් සෑම විට ම එම ඉරටු කැබලි තුන ත්‍රිකෝණයක පාද වන ලෙස ත්‍රිකෝණයක් නිර්මාණය කළ නොහැකි බව හඳුනාගන්නා ලදී.

i. ඒ අනුව පහත ප්‍රකාශයේ හිස්තැන් සම්පූර්ණ කරන්න.
ත්‍රිකෝණයක ඕනෑම පාද දෙකක දිගෙහි ............... ඉතිරි පාදයේ දිගට වඩා ...........වේ. (ලකුණු 02)

ii. පහත වගුව පිටපත් කරගන්න. එහි පාදවල දිග ලෙස සඳහන් මිනුම් අතරින් ත්‍රිකෝණයක් නිර්මාණය කළ හැකි අවස්ථා ඉදිරියෙන් "✓"ලකුණ ද නොහැකි අවස්ථා ඉදිරියෙන් "×" ලකුණ ද යොදන්න. (ලකුණු 02)

| පාදවල දිග | ත්‍රිකෝණයක් නිර්මාණය කළ හැකි/නොහැකි බව |
|---|---|
| 3cm, 4cm, 6cm | |
| 4cm, 5cm, 9cm | |

iii. cm/mm පරිමාණය සරල දාරය හා කවකටුව භාවිතයෙන් පහත නිර්මාණය කරන්න.
- AB = 8cm වන, සරල රේඛා ඛණ්ඩයක් නිර්මාණය කරන්න. (ලකුණු 02)
- AC = 6cm ද BC = 10cm ද වන ලෙස ABC ත්‍රිකෝණය නිර්මාණය කරන්න. (ලකුණු 03)
- BAC අගය මැන ලියන්න. (ලකුණු 02)

(b) ඝනවස්තු පාඩමේ දී භාවිත කළ සිද්ධාන්ත හා ක්‍රියාකාරකම් ඇසුරින් පිළිතුරු සපයන්න.

i. ප්ලේටෝ කැටවල දැකිය හැකි පොදු ලක්ෂණයක් ලියන්න. (ලකුණු 02)

ii. පහත දී ඇති පතරම භාවිතයෙන් ඔබ විසින් සකස් කළ ප්ලේටෝ කැටයේ නම කුමක් ද? (ලකුණු 01)



iii. එම ඝන වස්තුව ඔයිලර් සම්බන්ධතාවය සමඟ අනුකූල වන බව පෙන්වන්න. (ලකුණු 02)

02. (a) සුළු කරන්න.

i. $1\frac{1}{4} \times \frac{3}{5}$ ii. $\frac{3}{8} \div 2\frac{1}{4}$ (ලකුණු 03)

(b) A = 12.4 ද B = 100 ද C = 0.31 ද වේ.

i. C × B හි අගය සොයන්න. (ලකුණු 02)

ii. A × C හි අගය සොයන්න. (ලකුණු 02)

(c) 15m දිග රිබන් පටියක් 0.75m බැගින් දිග කැබලි කීයකට කැපිය හැකිද? (ලකුණු 02)

50661

03. (*a*) හවුල් ව්‍යාපාරයක් සඳහා කාන්තාවන් දෙදෙනෙකු එකම වර්ෂයක් තුළ මුදල් යෙදූ ආකාරය පහත දැක්වේ.

- ▲ නිපුනි ජනවාරි 01 වන දින රුපියල් 20 000ක් යොදා ව්‍යාපාරයක් ආරම්භ කළාය.
- ▲ ශාක්‍යා මාර්තු 01 වන දින රුපියල් 30 000ක් යොදා ව්‍යාපාරයට සම්බන්ධ වූවාය.

ව්‍යාපාරය අරඹා වසරකට පසු ඔවුන් අතර ලාභය බෙදා ගැනීමට තීරණය විය.

i. ශාක්‍යා ව්‍යාපාරයට සම්බන්ධ වූ කාලය මාස කීයද? (ලකුණු 01)

ii. වසරකට පසු නිපුනි හා ශාක්‍යා අතර ලාභ බෙදිය යුතු අනුපාතය සොයන්න. (ලකුණු 04)

iii. වසර අවසානයේ දී ව්‍යාපාරයෙන් ඉපයූ ශුද්ධ ලාභය රුපියල් 72 000ක් නම් නිපුනිට වඩා ශාක්‍යාට ලැබුණු මුදල සොයන්න. (ලකුණු 02)

(b) ගුණසිංහ මහතාගේ මාසික වැටුප රුපියල් 80 000කි. ඔහු ඉන් 20% ආහාරපාන සඳහා ද 30% දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා ද ඉතිරි මුදල් වෙනත් අවශ්‍යතා සඳහා ද වෙන් කරයි.

i. ආහාරපාන සඳහා වෙන් කළ මුදල කීයද? (ලකුණු 02)

ii. වෙනත් අවශ්‍යතා සඳහා වෙන් කළ මුදල කීයද? (ලකුණු 02)

04. (*a*) i. $x$ හා $y$ අක්ෂ -5 සිට +5 තෙක් අංකනය කළ කාටීසීය තලයක් අඳින්න. (ලකුණු 02)

ii. කාටසීය තලය මත A (3,3) හා C (4,1) ලක්ෂ්‍යය ලකුණු කරන්න. (ලකුණු 02)

iii. ABCD සෘජුකෝණාස්‍රයක් ලැබෙන පරිදි B හා D ලක්ෂ්‍යය ලකුණු කර ඛණ්ඩාංක ලියන්න. (ලකුණු 02)

iv. AD රේඛාවේ සමීකරණය ලියන්න. (ලකුණු 01)

(b)

| පැනක මිල රු. 25 කි. පොතක මිල රු. $a$ වේ. |
|---|

තෑගි පාර්සලයක පොත් 3 හා පැන් 2ක් අඩංගු වේ.

i. තෑගි පාර්සලයක් සඳහා වැය වන මුදල වීජීය ප්‍රකාශනයකින් දක්වන්න. (ලකුණු 01)

ii. එවැනි පාර්සල් 5ක් සකස් කිරීමට රුපියල් 1 525ක් වැය විය. සමීකරණයක් ගොඩනගා පොතක මිල සොයන්න. (ලකුණු 03)

05. (a) A = {1 ත් 20 ත් අතර ඇති 6 හි ගුණාකාර }
B = {10 ත් 20 ත් අතර ප්‍රථමක සංඛ්‍යා }
D = $\phi$

Learning Resource Centre
R
De Mazenod College
Kandana

i. A කුලකය අවයව සහිතව ලියන්න. (ලකුණු 02)

ii. ............. ∈B මෙහි හිස්තැනට සුදුසු සංඛ්‍යා සියල්ලම ලියා දක්වන්න. (ලකුණු 02)

iii. n(D) කීය ද? (ලකුණු 01)

iv. අභිශුන්‍ය කුලකයකට උදාහරණයක් පොදු ලක්ෂණයක් මගින් ලියන්න. (ලකුණු 02)

(b) හේතු දක්වමින් $x$ හි අගයත් $y$ හි අගයත් සොයන්න.

(ලකුණු 04)



06. (a) නව නිර්මාණ ප්‍රදර්ශනයක් සඳහා පාසල් කිහිපයකින් ලැබුණු නිර්මාණ ගණන දැක්වෙන අසම්පූර්ණ වෘන්ත පත්‍ර සටහනක් පහත දැක්වේ.

| වෘන්තය | පත්‍ර | | | | |
|---|---|---|---|---|---|
| 2 | 0 | 2 | | | |
| 3 | 1 | 4 | 5 | | |
| 4 | 0 | 0 | 2 | 3 | 6 |
| 5 | 1 | 2 | 7 | | |
| ......... | ......... | ......... | | | |

යතුර 3/1 යනු 31 වේ.

i. පාසල් දෙකකින් එවා තිබුණු 64 සහ 69 යන නිර්මාණ සංඛ්‍යා මෙහි ඇතුළත් කර නොමැත. එම දත්ත ඇතුළත් කර වෘන්ත පත්‍ර සටහන සම්පූර්ණ කරන්න. (ලකුණු 03)

ii. නිර්මාණ එවා ඇති මුළු පාසල් සංඛ්‍යාව කොපමණද? (ලකුණු 01)

iii. එම දත්තවල පරාසය සොයන්න. (ලකුණු 02)

iv. එම දත්තවල මාතය සොයන්න. (ලකුණු 01)

(b) වී ගබඩාවක වී මෙට්‍රික් ටොන් 17.5ක් ඇත. ලොරියක එක වරකට ප්‍රවාහනය කළ හැක්කේ 50kg බැගින් වන වී මලු 40ක් පමණි. ගබඩාවේ වී සම්පූර්ණයෙන් ප්‍රවාහනය සඳහා එම ලොරිය කී වාරයක් ගමන් කළ යුතු ද? (ලකුණු 04)

07. (a) PQRS යනු නාම පුවරුවක් සඳහා සකස් කළ තහඩුවකි.




i. PQS ත්‍රිකෝණයේ වර්ගඵලය සොයන්න. (ලකුණු 02)

ii. PQRS චතුරස්‍රයේ වර්ගඵලය සොයන්න. (ලකුණු 03)

iii. SR = 15cm ද PQ = 13cm ද නම් එම තහඩුව වටේට රිදී පාට නූලක් ඇලවීම සඳහා අවශ්‍ය නූලේ අවම දිග සොයන්න. (ලකුණු 01)

(b) දිග, පළල, උස පිළිවෙලින් 15cm, 12cm, 10cm වන ඝනකාභාකාර භාජනයක් ඇත.

i. එම භාජනයේ පරිමාව සොයන්න. (ලකුණු 02)

ii. එම භාජනය තැඹිලි වතුර වලින් පිරවූ විට එම වතුර එක් අයෙකුට 125ml බැගින් 16 දෙනෙකුට සංග්‍රහ කිරීමට ප්‍රමාණවත් බව අශාන් පවසයි. ඔබ එම අදහසට එකඟ වන්නේ ද? පැහැදිලි කරන්න. (ලකුණු 03)



පොත් 3 ක් ගත්තොත්,
1 ක්
නොමිලේ.
25%
දක්වා වට්ටම් හිමිකරගන්න.
හොඳම පොත් අඩුම මිලට අපෙන් විතරමයි...
Atlas
Richard
RATHNA EXERCISE BOOKS
දැන්ම lol.lk වෙත පිවිසෙන්න
CASH ON DELIVERY
VISA
mastercard
KOKO
LOL.LK
LOL STORE (PVT) LTD
COD
CASH ON DELIVERY
037 20 60 110
071 77 74 440

# 8 ශ්‍රේණිය කෙටි සටහන් පොත් Short Notes




Rs : 300




Rs : 300




Rs : 300




Rs : 300




Rs : 300




Rs : 300




Rs : 300




Rs : 300




Rs : 300




Rs : 300




Rs : 300




Rs : 300




Rs : 300

## 8 ශ්‍රේණිය ඉංග්‍රීසි මාධ්‍ය කෙටි සටහන් පොත් English Medium Short Notes




Rs : 180




Rs : 180




Rs : 180

මෙම කෙටි සටහන් පොත් සකස් කොට ඇත්තේ ජාතික අධ්‍යාපන ආයතනය මගින් සම්පාදනය කොට ඇති නව විෂය නිර්දේශය අනුව, විෂය ප්‍රවීණත්වයෙන් යුත් සම්පාදක මණ්ඩලයක් විසින්, එහෙයින් මෙහි අන්තර්ගත සියලු සටහන් එම විෂය නිර්දේශයේ සෑම මාතෘකාවක්ම ආවරණයකොට තිබේ. මෙම ග්‍රන්ථ සම්පාදනය කිරීමේ දී පූර්ණ අවධානය යොමුකොට ඇත්තේ සිසුන්ට මෙන්ම ගුරුවරුන්ට ද අවශ්‍යයෙන්ම මතකයේ තබා ගත යුතු සියලු කරුණු අන්තර්ගත කරමින් වන හෙයින් වෙනත් අතිරේක ග්‍රන්ථ පරිහරණයකින් තොරව වුවද අදාල විෂය නිර්දේශයේ වැදගත් කරුණු සියල්ල ඉතා පහසුවෙන් හැදෑරීමේ මෙන්ම මතකයේ රඳවා ගැනීමේ හැකියාව ද ලැබෙනු ඇත.


LOL.LK
LOL STORE (PVT) LTD
CASH ON DELIVERY | VISA | mastercard | KOKO
037 20 60 110
071 77 74 440
Buy Now
CLICK HERE